(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 23]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0063/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1994 අගෝස්තු 25 වැනි දින වන විට සහ අද වන විට ක්‍රියාත්මකව පවතින පාසල් (ජාතික පාසල් සහ පළාත් පාසල්) සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 1994 අප්‍රේල් මස 25 වැනි දින වන විට සහ අද වන විට එම පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(iii) 1994 වර්ෂයේ අප්‍රේල් මස 25 වැනි දින වන විට සහ මෙම වර්ෂයේ අද දින වන විට අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුළු මුදල් ප්‍රමාණයන් සහ එම මුදල් ප්‍රමාණයන්හි අගයන් ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 1994 අප්‍රේල් මස 25 වැනි දින සහ අද දින ඩොලරයක අගය රුපියල් වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙරට අධ්‍යාපන පද්ධතිය පසුගිය වර්ෂ 14 තුළ දියුණු වී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ පිළිගන්නේ නම්, එයට හේතුව සහ ඉන් අත් වූ ප්‍රතිලාභ එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0065/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 සිට මේ දක්වා කොළඹ වරායට පැමිණි, මෙරට බහලු සංඛ්‍යාව සහ ප්‍රතිනැව්ගත කිරීම සඳහා වූ බහලු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් වාර්ෂික පදනමින් කොපමණද;

(ii) ඒ අතුරින් සවුත් ඒෂියන් ගේට්වේ ටර්මිනල් (SAGT) නමැති පර්යන්තය හරහා හසුරුවනු ලැබූ මෙරට බහලුවල ප්‍රතිශතය කොපමණද;

(iii) SAGT ආරම්භ වූ දා පටන් එමගින් රජය ලබා ගත් ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ආදායම් සහ සවුත් ඒෂියන් ගේට්වේ ටර්මිනල් (SAGT) ව්‍යාපෘතිය මගින් ලබා ගැනෙනු ඇතැයි පුරෝකථනය කරන ලද ආදායම අතර වාර්ෂික පදනමින් වූ සංසන්දනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ වරායෙහි සහ SAGT හි කාර්ය මණ්ඩලවල සාමාජික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කොළඹ වරායෙහි ශ්‍රමිකයන් සහ වෙනත් බඳවා ගැනීම් සඳහා වූ පිරිවැය කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0066/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව එතුමාගේ අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වන්නේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් සංස්ථාව එතුමාගේ අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වන්නේ නම්, මේ දක්වා වූ පසුගිය වර්ෂ තුනක කාලය තුළ —

(i) එම සංස්ථාවට ලැබීමට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම සංස්ථාව විසින් ගෙවිය යුතුව ඇති ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) වෙනත් ආයතන විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ගෙවිය යුතුව ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සතු වෙළෙඳපල කොටස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ආයතනය ඌන ප්‍රාග්ධන සැපයුමක් සහිත ආයතනයක්ද;

(ii) එසේ නම් එය නිසි ආකාරයෙන් පවත්වා ගෙන යෑම සඳහා කොපමණ මුදලක් අවශ්‍යද;

(iii) යම් ඖෂධ සම්බන්ධයෙන් එයට යම් ඒකාධිකාරී තත්ත්වයක් තිබේද;

(iv) එසේ නම්, ඒ කවර ඖෂධ සම්බන්ධයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0159/'08

4.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ නගර සංවර්ධනය සඳහා රුපියල් මිලියන 889 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0160/'08

5.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, ප්‍රජා ජල සම්පාදනය සඳහා රුපියල් මිලියන 1940 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0161/'08

6.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යටතේ ඇල මාර්ග පුනරුත්ථාපනය හා නඩත්තුව සඳහා රුපියල් මිලියන 72 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0360/'08

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මායිම් ගම්මාන, මාර්ග බාධක ඇතුළු විවිධ ස්ථානවල ආරක්ෂාව සඳහා යොදවා ඇති සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්ගේ වැටුප් විෂමතාවයක් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ 18කට ආසන්න කාලයක් සේවයේ යෙදී සිටින නිලධාරීන්ටත්, නිසි බඳවා ගැනීම් යටතේ සේවයට එක්වන නිලධාරීන්ටත් එකම වැටුප් තලයක් හිමිවීම නිසා එම නිලධාරීන් උදාසීන තත්ත්වයට පත්ව ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) පොලිස් නිලධාරීන්ගේ රාජකාරි හා සමානව කැපවීමකින් රාජකාරි ඉටුකරන සිවිල් ආරක්ෂක බලකායට විධිමත් වැටුප් ක්‍රමයක් සකස්කර සේවය ස්ථිර කර විශ්‍රාම වැටුප් තත්ත්වයට පත්කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0361/'08

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) අනුරාධපුර බටහිර, මහවිලච්චිය ගොවි ජනපදයේ දකුණු ඉවුර අංක 512, ඉඩමේ පදිංචිව සිටි යූ. බී. කරුණාරත්න නමැති අය 2007 අගෝස්තු මස 14 වැනි දින රාත්‍රී ඔහුගේ කුඹුරේ පැලට ගොස් සිටියදී අවිගත් කණ්ඩායමක් විසින් පැහැර ගෙන ගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මොහු සොයා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) මොහු දැනට ජීවතුන් අතර සිටී නම් ඒ කවර ස්ථානයකද;

(iii) මොහුගේ පැල අසල ග්‍රාම ආරක්ෂක භටයන් දෙදෙනෙකු සේවයේ යෙදී සිටියදීත් මොහු පැහැර ගැනීමට ලක්වූයේ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0362/'08

9.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) 2007 ජනවාරි මස 11 සහ 12 වැනි දිනවල වලපනේ ප්‍රදේශයට ඇදහැලුනු අධික වර්ෂාව හේතුවෙන් ඇතිවූ නායයාමෙන් අවතැන්වූ පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම අවතැන්වූ පවුල් අතුරින් මේ දක්වා කූඩාරම්වල ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම අය නැවත පදංචිකිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එතෙක් මොවුන්ට ලබාදී ඇති සහනාධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0497/'08

10.

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාර්ලිමේන්තු හෝ පළාත් සභා මන්ත්‍රීවරුන් නොවන ත්‍රස්තවාදී තර්ජනද නොමැති අය වෙත රජයේ ආරක්ෂක නිලධාරීන් ආරක්ෂාව සඳහා යොදවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස ආරක්ෂාව ලබන පුද්ගලයින් කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම පුද්ගලයින් වෙත මෙලෙස ආරක්ෂාව ලබාදීමට නිර්දේශ ලබා දී ඇත්තේ කවුරුන් විසින්ද;

(ii) එම ආරක්ෂාව ලබාදී ඇති පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙලෙස ආරක්ෂාව ලබන අය එම ආරක්ෂාව වරප්‍රසාදයක් කර ගනිමින් විවිධ සමාජ විරෝධී කාර්යයන්හි නිරත වන බවට චෝදනා එල්ල වන බැවින් එම ක්‍රියාවන් නතර කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0498/'08

11.

ගරු විජිත හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මැක්ඩොනල්ඩ්ස් රෙස්ටෝරන්ට් ආයතනය පිහිටුවීම සඳහා රාජගිරිය කොටා පාරේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක්, අබාන්ස් රෙස්ටෝරන්ට් (පුද්ගලික) සමාගමට ලබා දී ඇත්තේ කවර පදනමක් මතද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාළ එකඟතා ගිවිසුම එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම සමාගම මගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට නිල නිවාස ඉදිකර දීමට එකඟ වී තිබේද;

(ii) එසේ නම්, එකඟ වූ දිනය වන විට ඉදිකර දී ඇති නිල නිවාස සංඛ්‍යාව කොපමණද; සහ

(iii) එකඟ වූ පරිදි නිල නිවාස ඉදිකර නොදීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0635/'08

12.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් බදු පදනම යටතේ පෞද්ගලික වතු සමාගම් වලට ලබා දෙන විට එම එක් එක් වතුවල තිබූ, කොස්, නැදුන් සහ මැහෝගනී ආදී ගස් ප්‍රමාණය කොපමණද යන්න ලේඛනගත කර තිබේද;

(ii) මේ වන විට එම ගස්වලින් කොපමණ ප්‍රමාණයක් ඉතිරිවී තිබේද;

(iii) ඉවත් කර තිබේනම් එම ගස් ප්‍රමාණය කොපමණද;

(iv) ඒ කවර කරුණක් සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) ඉහත බදු දී තිබෙන වතුවල තිබූ කොස් ගස් විශාල ප්‍රමාණයක් කපා ඉවත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) මෙලෙස ගස් කපා ඉවත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ අදාළ අමාත්‍යාංශයෙන් අනුමතිය ලබා ගෙන තිබේද;

(ඈ) නිලධාරීන් එම දැව ලබා ගැනීමේ දී නීතිය ක්‍රියාත්මක වන බවට අදාළ අමාත්‍යාංශය මගින් සොයා බලන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) එලෙස වාර්තාවීම් සම්බන්ධයෙන් පියවර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0636/'08

13.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයට අයත්ව තිබූ හා පෞද්ගලික අංශයට බදු පදනම යටතේ ලබාදී තිබෙන ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති වතු නම් වශයෙන් කවරේද;

(ii) එලෙස බදු දෙන විට එම එක් එක් වතු වල තිබූ වගාවන් හා එම හෙක්ටයාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයට අදාළ බදු ලැබෙන්නේ වාර්ෂිකව ද නැතහොත් මාසිකවද;

(iv) ඉහත බදුදීම මගින් ඒ ඒ වතු මගින් රජයට ලැබී ඇති ආදායම අදාළ බදු දීම කළ වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් බදු දෙන විට රබර් වගාකොට තිබූ හෙක්ටයාර ප්‍රමාණය සහ මේ වනවිට තිබෙන හෙක්ටයාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) තේ කම්හල්, බේකරි, ආපනශාලා සහ ගෘහ පරිභෝජනය සඳහා රබර් දර ප්‍රයෝජනවත් වුවද, මේ වනවිට රබර් ගලවා දමා ඒ වෙනුවට ඔයිල් පාම් වගාව ව්‍යාප්ත කිරීම වතු සමාගම් මගින් සිදුකරන බැවින් ඉදිරියේ දී මෙම තත්වය වෙනස් කර රබර් වගාව ව්‍යාප්ත කිරීමට එතුමා අවශ්‍ය උපදෙස් ලබාදෙන්නෙහිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0637/'08

14.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොතලාවල කොටලපද්දලගම, නො.02 කොටසේ සහ අක්කර 80 ප්‍රදේශ ආවරණය වන, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් හා රජයට පවරාගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් 2007 දෙසැම්බර් මාසය වන විට බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) මෙම ඉඩම්ලාභීන්ගේ නම්, ලිපිනයන් සහ ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) එම ඉඩම්ලාභීන් අදාළ ඉඩම්වල පදිංචි වී හෝ භුක්තියේ සිටින්නේ ද;

(ii) තමාට ලැබුණු ඉඩම් කොටස වෙනත් අයකුට පවරා හෝ නීත්‍යානුකූල නොවන අයුරින් විකුණා ඇත්නම් ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එසේනම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) රජයෙන් නොමිලේ ඉඩම් ලබාගැනීමෙන් පසු ඒවා විකුණා නැවත රජයේ ඉඩම් අනවසරයෙන් අත්පත් කරගැනීම මෙම ප්‍රදේශවල බහුලව සිදුවන බැවින් රජයට අයත් ඉඩම් රැකගැනීම සඳහා මායිම් සලකුණුකර අවශ්‍ය පියවර ගැනීම කොපමණ කාල සීමාවක් තුළ සිදුකරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0667/'08

15.

ගරු සමන්සිරි හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැල්ලවාගාර, මාදම්පේ ලිපිනයැති ආර්.පී. විජේරත්න මහතා නාවික හමුදාවේ සේවය කළ කාලය කොපමණද;

(ii) ඔහු සේවයෙන් ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) ඔහු සේවයෙන් ඉවත් කිරීමට පෙර හෝ පසු, ඔහුට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් සිදුකර තිබේද;

(iv) එසේනම් ඒ කවදාද යන්න හා එම පරීක්ෂණය සිදුකළ නිලධාරීන් කවුරුන්ද;

(v) විනය පරීක්ෂණයේ දී ඔහුට විරුද්ධ ව තිබූ කරුණු හෝ චෝදනා කවරේද;

(vi) මෙම පරීක්ෂණයෙන් පසුව ඊට අදාළ වාර්තා හා ලේඛන ඔහු වෙත ලබාදීමට කටයුතුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආර්. පී. විජේරත්න මහතා නැවත සේවයේ පිහිටුවීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන),— 2003 අංක 35 දරන ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන),— 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන),— ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

4.

ප්‍රවාහන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (සංශෝධන),— 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

### යෝජනා පිළිබඳ දැනුම්දීම

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උපදේශක කාරක සභා,— ස්ථාවර නියෝග 106 හි විධිවිධානවල සහ 2008.07.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ උපදේශක කාරක සභාව, තේරීම් කාරක සභාවට විසින් පත් කරනු ලබන පස් (05) දෙනෙකුට නොඅඩු සහ තිස් තුන් (33) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් තේරීම් කාරක සභාව විසින් පත් කළ යුතුය.

7.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව,— ස්ථාවර නියෝග 128 හි විධිවිධානවල සහ 2008.07.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරුන් තිස් තුන් (33) දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

8.

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය.

"1981 අංක 43 දරන ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජුනි මස 27 දිනැති අංක 1555/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*5.

වීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඕ) සහ (ක) ඡේද යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2007 දෙසැම්බර් මස 17 දිනැති අංක 1528/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*7.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 1),— 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ දෙවැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2007 ජනවාරි මස 22 දිනැති අංක 1481/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*8.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 2),—1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ දෙවැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 13 දිනැති අංක 1536/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

* 9.

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*10.

අධ්‍යාපන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 212— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හාරසිය හතළිස් එක් මිලියන අටසිය දහසකට (රු. 441,800,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 212 | — | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන ක්‍රියාකාරකම් | | |
| | | | පුනරාවර්තන වියදම් | රු. | 441,800,000 |
| | | | ප්‍රාග්ධන වියදම් | රු. | — |
| | | | එකතුව | රු. | 441,800,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 අගෝස්තු මස 22 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 5 දක්වා එකතුව රුපියල් 15,070,180,332.

*11.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*12.

ජාතික මංමාවත් පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*13.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*16.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*20.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*21.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*22.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*23.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

# 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම" දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 1,000,000,000<br>680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.<br>රු. | 3,800,000,000<br>3,900,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.<br>රු. | 400,000,000<br>550,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*26.
අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*27.
වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*28.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධූරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධූරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධූරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*34.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*35.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

36.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---